ඓතිහාසික බෞද්ධ ආරාමික චිකිත්සක විධික්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (වාස්තු විද්‍යාත්මක හා අභිලේඛන සාධක ඇසුරෙන්)

ගල්වැවේ විමලඛන්ති හිමි
උල්පතගම අමිතරතන හිමි

හැඳින්වීම

අතීතයේ මානවයා විසින් සර්වාංග රෝග නිවාරණය කිරීම සඳහා භාවිත ආරාමික චිකිත්සක ක්‍රම සහ පුරාණ වෛද්‍ය ක්‍රමවේද පිළිබඳ මූලික වශයෙන් අධ්‍යයනයට බඳුන් කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණු අතර වෙයි. සාමාන්‍ය ජනතාවගේ නිරෝගීභාවය හා ස්වස්ථතාව සම්බන්ධයෙන් පැරණි වෛද්‍ය ග්‍රන්ථවල සඳහන් වන තොරතුරු හැරෙන්නට වෙනත් සාධනීය සාධක අනාවරණය නොවන අතර, ආරම්භක ස්වස්ථතාව සම්බන්ධයෙන් බොහෝ ලිඛිත පුරාවිද්‍යාත්මක සාධක බහුලව අනාවරණය වේ. භාරතීය ජනතාවගේ මුල් බැසගත් වෛද්‍ය ක්‍රම ශ්‍රී ලාංකික මුල් වැසියන් භාවිත කරන්නට ඇති බවත්, ලාංකික දේශීය වෛද්‍යවරුන්ගේ අනුගත ක්‍රමය වූයේ ආයුර්වේදය බවත් පරණවිතාන මහතා සාධක සහිතව පෙන්වා දෙයි. උත්තර භාරතීය සංඝ සමාජ ක්‍රමය ශ්‍රී ලංකාවට අනුගතවීමත් සමග ඒ හා බැඳී අනෙකුත් සියලුම ආගමික මෙන් ම සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධ ක්‍රමවේදයන් ද ශ්‍රී ලංකාව තුළ මුල් බැස ගන්නට ඇති බව පැහැදිලි වන කරුණකි. සමකාලීන ආගමික සබඳතා හේතුවෙන් අනෙකුත් සමාජ හා සංස්කෘතිකමය සබඳතා හුවමාරු වූයේ නම් සෞඛ්‍ය සම්බන්ධ වූ ද සෞඛ්‍යාරක්ෂාව හා වෛද්‍ය ක්‍රම සම්බන්ධ වූ ද සියලුම චිකිත්සක ක්‍රමවේද මේ අනුව හුවමාරු වන්නට ඇති බැව් උපකල්පනය කළ හැකිය. අශෝක අධිරාජයා මනුෂ්‍යයන්ට මෙන් ම සත්වයින්ට ද වෙදකම් කිරීමට අවශ්‍ය ඖෂධ පැළෑටි ලබාදුන් බව දෙවන ගිරි ලිපියේ ''සවතා දේවානම්පියසා පියදසිසා ලජිනෙ දුවෙ චිකිසකා කතා මනුස චිකිසා පසු චිකිසාචා'' සඳහන් වේ.[1] දේවානම්පිය ප්‍රියදර්ශී රජතුමා චිකිත්සක ක්‍රම දෙකක් හඳුන්වා දුන් බවත් ඒ මනුෂ්‍ය

චිකිත්සක ක්‍රම හා සත්ව චිකිත්සක ක්‍රම වශයෙන් හඳුන්වා දිය හැකි බවත් සෑම (ගිර්නාර්, ජෞගඩා, ෂාහබෂ්ගර්) දෙවන (02) ගිරි ලිපියක ම සටහන් කර තිබේ.[2] එසේම බෙහෙත් හේත් සඳහා අවශ්‍ය පැලෑටි හා ගස් නොමැතිනම් ඒවා ගෙනවිත් වගා කළ යුතු බව ද එහි සටහන් කොට තිබේ. මෙම තොරතුරු උත්තර භාරතීය වෛද්‍ය ශාස්ත්‍රය මෙරටට ආගමනය වීම පිළිබඳව එය ද ප්‍රබල සාක්ෂියක් වේ.

සෞඛ්‍යාරක්ෂක විධික්‍රමයන් පිළිබඳ තවදුරටත් සාකච්ඡා කිරීමේ දී විෂය ක්ෂේත්‍රයේ බහුලව අනාවරණය වන අංශයක් ලෙස ආරාම ආශ්‍රිත ස්වස්ථතාව පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කිරීමට මූලාශ්‍ර, ලිඛිත, අලිඛිත ජනප්‍රවාද සාහිත්‍ය හා නටබුන් වශයෙන් ශේෂව ඇති සාධක බහුලව උපයෝගි කර ගැනීමේ හැකියාව ලැබේ. තව ද විවිධ රාජ්‍ය පාලකයන් විසින් ආගමික ස්ථාන සඳහා පැවරුම් ප්‍රදාන සහ ඉදිකිරීම් පිළිබඳ බෞද්ධාගමික හා සමාජමය කෝණ විමසා බැලීම සිදු කළ හැකිය.

අරමුණ

අතීතයේ විවිධ රෝගකාරක සම්බන්ධයෙන් වෛද්‍යවරුන් අනුගමනය කළ වෛද්‍ය ක්‍රමවේද හා චිකිත්සක ක්‍රමයන් මොනවාද යන්න හඳුනා ගැනීම. ඓතිහාසික යුගයේ වෛද්‍ය ක්‍රමවේද පිළිබඳ අවබෝධය පුළුල් කිරීමත් මේ පර්යේෂණයේ අරමුණු අතර වෙයි.

ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රය මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන් උපයෝගී කර ගනු ලබන අතර ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදය ප්‍රධාන වශයෙන් භාවිතයට ගනු ලැබේ.

සාකච්ඡාව

ලෝකයේ ඕනෑම ශිෂ්ටාචාරගත වූ මානව සමාජයක ඔවුන්ගේ දෛනික සෞඛ්‍ය කටයුතු පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් කරුණකි. ඒ අනුව සනීපාරක්ෂාව වූ කලී සත්වයාගේ පැවැත්

ම උදෙසා අතිශය අවශ්‍ය වූවකි. එය ගිහි පැවිදි දෙපක්ෂයට ම නො අඩුව තිබිය යුතු සාධකයකි. යම් සමාජයක් ක්‍රමයෙන් දියුණු වීමේ දී මෙම කටයුතු සංකීර්ණත්වයට පත් වන ආකාරය මෙන් ම එම කටයුතු ආයතන ගතවන ආකාරය හඳුනා ගත හැකිය. ක්‍රි.ව. 4 වන සියවසේ සිට අනුරාධපුර යුගයේ අවසානය දක්වා වූ කාල වකවානුව සම්බන්ධයෙන් ද මෙම ප්‍රකාශය සාධාරණ වන බව පෙනී යයි.

ලිඛිත, අලිඛිත හා ජනප්‍රවාද තුළ සඳහන් වන පරිද්දෙන් සෞඛ්‍ය වෘත්තිකයන්, සෞඛ්‍ය මධ්‍යස්ථාන හා ඒවායේ පරිපාලනය පිළිබඳ ස්වස්ථතාව හා බැඳුණු වෙනත් සංකල්ප පිළිබඳව ද තොරතුරු අනාරවණය වේ. ඒ අනුව සෞඛ්‍යාරක්ෂාව නොහොත් ස්වස්ථතාව පිළිබඳ විවිධ විද්වතුන් විවිධාකාර අර්ථකථනයන් ඉදිරිපත් කොට තිබේ. ඒ අනුව බෞද්ධ ශබ්ද කෝෂයෙහි දක්වනුයේ. ස්වස්ථ (සං + ස්වස්ථ) යහපත් බව, සැපවත් භාවය, සුඛිත බවයි.[3] විමල් හේවාමානගේ බෞද්ධ ස්වස්ථතාව යන ග්‍රන්ථයෙහි මෙසේ දක්වයි. ''ස්වාමින් තිෂ්ටතීති (ස්ව + ස්ථා + කඃ) සුස්ථඃ'' ලෙසත්, ස්වස්ථ යන වදන පිළිබඳ ශබ්දකල්පද්‍රැමය අර්ථ දක්වයි. ස්වස්ථ යන්න ත්‍රි ලිංගික නාමයකින් ''තා'' ප්‍රත්‍ය එකතු වීමෙන් සෑදෙන්නේ ස්වස්ථතා යන්න භාව තද්ධිත පදයකි. ආරෝග්‍ය, ස්වස්ථ්‍ය, ආරෝගිතා, කුසල, ආරෝග, සුස්ථතා, සුස්ථිති, වාර්ත, රෝග භාව, නිරාමයත්ව, අනාමය, කල්‍යතා, ශරීරසුව, සනීපය, නිරෝගිකම යන වදන් ස්වස්ථතා පර්යාය නාම ලෙස ව්‍යවහාර වනු පෙනේ.[4]

ඓතිහාසික චිකිත්සක ක්‍රමවේදයන් පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමේදී සුමංගල ශබ්ද කෝෂයේ චිකිත්සක යන වචනය සඳහා අර්ථ කිහිපයක් ලබා දී තිබේ. චිකිත්සක - වෛද්‍යයා, චිකිත්සා පිළියම, වෙදකමකාර - වෙදකම් කරන්නා චිකිත්ස්‍ය - පිළියම් කළ හැකි යනුවෙනි.[5]

සාරාර්ථ සංග්‍රහයෙහි විවිධ චිකිත්සක ක්‍රමවේදයන් හඳුන්වා දී තිබේ. 01. ගර්භණී චිකිත්සක ක්‍රම, 02. කුමාර චිකිත්සක ක්‍රම, 03. ශිරෝරොග චිකිත්සක ක්‍රම යනුවෙනි. මෙහි ගර්භණී චිකිත්සක ක්‍රමවේදයේදී පිරිපුන් දරුවෙකු නිර්මාණය කර ගන්නා ආකාරය පිළිබඳව ඉතා මැනවින් කරුණු දක්වා තිබේ. එහි ලිංග භේදය, කැමති

දරුවෙකු ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදයන්, ගර්භණී සමයේ ලබා දිය යුතු ඖෂධ වර්ග, ගර්භාරක්ෂක විධික්‍රමයන් හා ඒ සඳහා භාවිත ඖෂධ වර්ග, විෂ ශරීරගත වූ පසු ඒවා ඉවත් කිරීම සඳහා යොදා ගන්නා විවිධ චිකිත්සක ක්‍රමවේද, උණට, ශෝථයට, වමනයට, මහලෙයට, ගර්භශූලයට, මාසානු මාසික කාර්යය ක්‍රමය (ඔසප් චක්‍රය) නාරී හා ප්‍රසව වේදනාවන්, සූතිකා චිකිත්සක ක්‍රම, ප්‍රසව වේදනා දුරු කිරීමට අනුගමනය කළ යුතු කරුණු වැදෑමහ වැටෙන්නට (ගර්භාෂයේ පවතින සියුම් සිවිය මෙම සිවිය දරු ප්‍රසූතියෙන් පසුව ඉවත් කළ යුතුය)[6] ආදී කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ගර්භණී චිකිත්සක ක්‍රමවේදයන් හඳුන්වාදී තිබේ.

කුමාර චිකිත්සක යනුවෙන් කොටසක් හඳුන්වා දී තිබේ. එහි දරුවෙකුගේ උපතේ සිට විවිධ අවස්ථාවන්හි ඇති වන රෝග කාරකයන් සඳහා විවිධ වර්ගයේ ප්‍රතිකා ක්‍රමවේදයන් හඳුන්වා දී තිබේ. ජාත කර්ම (දරුවෙකුගේ උපත සිදුවන ආකාරය) කිරි ලබා දීමේදි අනුගමනය කළ යුතු ක්‍රමවේද, දරුවන්ගේ උණට, අතීසාරයට, වමනපාතන දෙකට, වමන හති දෙකට, කැසීමට, වාතගුලයට, තාලුපාතයට, ඇසේ කිතියට, ඇස් ලෙඩවලට, කට තොල වන වීමට, රතගායට, බඩේ කැක්කුමට, ප්‍රඥා ආදිය වැඩිවීමට, ඇසේ පාට වෙනස් වීමට, හතියට, කරප්පන් ආදියට, මාන්දමට, නස්න විධි ක්‍රම, රෑට අඩනවාට.[7] යන ආදී රෝගකාරකයන් සඳහා මෙම ප්‍රතිකාර චිකිත්ක ක්‍රමවේදයන් හඳුන්වාදි තිබේ. එමෙන් ම ශිරෝරෝග වශයෙන් ස්ත්‍රී, පුරුෂ යන දෙපක්ෂයට ම අදාළ වන රෝගකාරකයන් සඳහා මෙම චිකිත්සක ක්‍රමවේදයන් පෙන්වාදී තිබේ.[8]

දේශීය වෛද්‍ය ක්‍රමවේද අතර නිල වෙදකම හා විදුම් පිළිස්සුම් වෙදකම ඉතා සාර්ථක ක්‍රමවේදයක් ලෙස දක්වා තිබේ. මනුෂ්‍ය ශරීරයේ නිල ස්ථාන සියගණනක් ඇත. ඉන් 107ක් මර්මස්ථාන ලෙස විස්තර කර ඇත. ඉන්ද මස්තිස්කය, හෘදය, ගුදය යන තැන් ප්‍රධාන වේ. මෙම මර්මස්ථාන පීඩාවට පත් වූවොත් මරණය සිදුවිය හැකිය. මෙම ත්‍රිමර්ම පමණක් නොව ඉහත කී මර්මස්ථාන 107 ම මඟ හරවා නිල ස්ථාන දක්වා ඇති බව පෙනේ. යෝගරත්නාකරය දක්වා ඇත්තේ ශරීරයේ සෑම අංශයකටම විහිදී ඇති නිල ස්ථාන ඇති බවය. එනම් නිල ප්‍රතිකාර විධි 09ක් දක්වා ඇත.

නිල ඇල්ලීම - නිල විද පිලිස්සීම

නිල තැවීම - නිල විද වණ කිරීම

නිල පිළිස්සීම - නිල විද බෙහෙත් ගැල්වීම

නිල විදීම - නිල විද ලේ හැරීම

- නිල විද ගැට ගැසීම[9]

නිල ඇල්ලීම කරන්නේ සාමාන්‍යයෙන් වේදනාව නැති කිරීමට හෝ සිහිමූර්ජා කිරීමටය. පුරාණ වෛද්‍යවරුන් රෝග සුව කිරීමට මෙන් ම සතුරාට පහරදීමේදි ආරක්ෂාව පතා රෝග කරවීම ද නිල ඇල්ලූ වෘතාන්ත ඇත. රෝග දහස් ගණනකට ප්‍රතිකාර කළ හැකි මෙම චිකිත්සා ක්‍රමය දේශීය වෛද්‍ය ක්‍රමයේ හඳුන්වනුයේ සල්ල විධි හා ශරවිධි යනුවෙනි. මෙයට අමතරව දේශීය ගෙඩි වෙදකම, අක්ෂි වෙදකම, කැඩුම් බිඳුම් වෙදකම, (ගස් වෙදකම) සර්ප විෂ වෙදකම, මෙරට විශේෂ වූ පාරම්පරික වෛද්‍ය ක්‍රමයන් ය. එයටත් වඩා විශේෂිත වන්නේ වෛද්‍යවරුන් නොවන අත්දැකීම් ඇති ඇසූපිරූ තැන් ඇති ශ්‍රී ලාංකිකයින් අදටත් සුළු සුළු ආබාධ සඳහා භාවිත කරන ගොඩ වෙදකම් ය.[10] මෙහි දක්නට ලැබෙන තොරතුරු අනුව මිනිසාගේ ශරීරයේ හට ගනු ලබන බොහෝ රෝගකාරකයන් සඳහා මෙම චිකිත්සක ක්‍රමවේදයන් බහුලව යොදා ගනු ලබන බව දක්නට ලැබේ.

''ආරෝග්‍යා පරමා ලාභා - සන්තුට්ඨි පරමං ධනං

විස්සාසා පරමා ඤාතී - නිබ්බාණං පරමං සුඛං''

සියලු ලාභයන්ට වඩා නිරෝගි බව උතුම් ලාභයකි. නිරෝගි බව නැත්තහුට සම්පත්වලින් ප්‍රයෝජන නොලැබිය හැකිය.[11] යැ යි බුදුරජාණන් වහන්සේ දක්වා ඇත්තේ ඒ නිසා ය.

මිනිසා සමාජය සමග නිරතුරුව ම අන්තර් සබඳතා ගොඩනංවා ගැනීමට මුල් කර ගන්නා වූ කායික, වාචසික හා මානසික අංගයන් ක්‍රමානුකූල පරිවර්තනයකට යොමු කිරීමත්, මේ තුළින් සිදුවේ.

එය සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රි ශික්ෂා මගින් අර්ථවත් වේ. කාය, වාග් දොරටුවලින් විහිදෙන මානසික ක්ලේශ සන්තර්පනය හෙවත් ශක්තියෙන් විනාශ කිරීම සීලයෙන් සිදුකරයි. සිත තුළ නැඟ එන්නා වූ කෙලෙස් රෝග මැඩ ගැනීම සමාධියෙන් කරන අතර, ප්‍රඥාවෙන් සියල්ලෙහිම මූල ක්ෂය කිරීමත් සිදු කෙරේ. බුදු දහමෙහි සඳහන් කරන මානසික රෝගයක් නම් කෙලෙස් ය. කායික, මානසික යන දෙ අංශයෙහි ම නිරෝගිතාවය සෞඛ්‍ය බව බුදුදහමින් නිර්දේශිත ය.

බුදුදහම හා සෞඛ්‍ය යනු දෙකක් නොව එකක් තරමට දැඩි ලෙසට සම්බන්ධ වේ. එහි සෑම තැනක ම සෞඛ්‍ය සංරක්ෂණීය උපදෙස් රැසකි. එහි ප්‍රධානත ම ලක්ෂණය නම් චර්යාව හා සබැඳීම යි. විෂම චර්යා රටා රෝග සඳහා හේතුවන අතර, එහි මූල අටක් පිළිබඳව බුදුදහමින් අවධාරණය කරයි.

01. පිත්තසමුට්ඨානා ආබාධා

02. සෙම්හ සමුට්ඨානා ආබාධා

03. වාත සමුට්ඨානා ආබාධා

04. සන්නිපාතිකා ආබාධා

05. උතුපරිනාමජා ආබාධා

06. විසම පරිහාරජා ආබාධා

07. ඔපක්කමිකා ආබාධා

08. කම්ම විපාකජා ආබාධා[12]

මෙම රෝග ලක්ෂණ අටෙන් හතක් ම අප ජීවත් වන සමාජයේ කාලගුණික හා දේශගුණික විපර්යාස හේතු කොටගෙන නිර්මාණය වන රෝගාබාධයන් ය. ඒවා සමනය කර ගැනීම සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගතකළ යුතු බව මෙහිදී බුදුදහම අවධාරණය කරනු ලබයි. අප ලෝකයේ කුමන ස්ථානයක ජීවත් වුවත් ඒ ඒ දේශගුණයන්ට අනුව තම චර්යා ධර්මයන් පවත්වාගත යුතු වේ. මහාවග්ගපාළියේ හේඝජ්ජක්ඛන්ධකයේ භික්ෂූන් වහන්සේලාට

වැළඳුණු බොහෝ රෝගකාරකයන් ව්‍යුපසමනය කර ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් උපදෙස් රාශියක් මෙන් ම ඒ ඒ රෝග කාරකයන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර ක්‍රමවේද ද දක්වා තිබේ.[13]

මහාවග්ගපාළියේ භේසජ්ජක්ඛන්ධකයේ භික්ෂූන් වහන්සේලාට ඇති වූ යම් යම් රෝග පිළිබඳව ද එකී රෝග ව්‍යුපසමනය සඳහා යොදාගත් හා යොදාගත යුතු ප්‍රතිකාර ක්‍රම ද සඳහන් ය. මේ තුළ ඔවුන් විසින් හඳුනාගෙන තිබූ රෝග විසිතුනක් හා ඒ සඳහා නිර්දේශිත ප්‍රතිකර්ම ක්‍රම එනම් ඖෂධ විසිතුනක් පොදුවේ භාවිත කළ හැකි ඖෂධ පහක් වශයෙන් ඖෂධ 28ක් දක්වා තිබේ. ''ශරත් කාලයෙහි පිත්ත රෝගයෙන් පෙළෙන ලද භික්ෂූන් වහන්සේලා සඳහා ඖෂධ වශයෙන් බෙහෙත් වර්ග පහක් පෙන්වා තිබේ. ගිතෙල්, වෙඩරු, තල තෙල්, මී පැණි, උක් සකුරු යනුවෙනි.[14]

කාරක සඳහා ශාඛයන්හි මුල් හා අල වර්ග ඖෂධ වශයෙන් භාවිත කිරීමට සුදුසු බව දක්වා තිබේ. කහ, ඉඟුරු, වදකහ, හෙළ වදකහ, අති විඩයන්, කුළු රෑණ සුවඳ හොට, වම්මුතු, යන මුල් බෙහෙත් ද අනෙක් මුල් ද උචිත බව දක්වා තිබේ. මුල් කාලයෙහි මෙම මුල් වර්ග එපරිද්දෙන්ම ආහාරයක් වශයෙන් ගෙන තිබේ. එහෙයින් ඒවා ඇඹරීම සඳහා දා ගලක් සුදුසු බව දක්වා තිබේ. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා කහට බෙහෙත් වර්ගයන් ද දක්වා තිබේ. කොහොඹ කසට, කෙළිඳ කසට, දුම්මැල් කසට, හඟුලු කසට, කරඳ කසට, ඒ අතර වේ. එහි ම කොළ වර්ග ද ඖෂධ සකස් කර ගැනීම සඳහා උචිත බව දක්වා තිබේ. කොහොඹ කොළ, කෙළිඳ කොළ, දුම්මැල්ල කොළ, තලා කොළ, කපු කොළ වශයෙනි.[15] එමෙන් ම වසඟ සාල්, තිප්පිලි, ගම්මිරිස්, අරළු, බුළු, නෙල්ලි ගස්වල හටගන්නා මැලියම් වර්ග ඖෂධ සඳහා යොදා ගන්නා ආකාරය පෙන්වා දී තිබේ. හිඹගු දඬු තම්බාගත් මැලියම්, හිඹගු කොළ තම්බාගත් මැලියම්, රුක්හි මේරූ කොළ තම්බාගත් මැලියම්. දුම්මල යන මැලියම් බෙහෙත් ද පෙන්වා දී තිබේ. එමෙන් ම බෙහෙත් වර්ග සකස් කිරීමේ දී භාවිත කරනු ලබන ලුණු වර්ග කිහිපයක් ම දක්වා තිබේ. මූදු ලුණු, කළු ලුණු, සින්දු ජන පදයෙහි උපත් ලුණු, සුවස ලුණු, බළල් ලුණු, යන ලුණු මිශ්‍රණ බෙහෙත් ද දක්වා තිබේ. එමෙන් ම කැසීම් රෝගාදිය සඳහා ද ඖෂධ වර්ග දක්වා තිබේ.[16]

භාරතයේ පහළ වූ අශෝක අධිරාජයා විසින් ද තම පාලන තන්ත්‍රය ගෙන යෑමේ දී ජනතාවට සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගොඩනංවාලීම සඳහා ක්‍රියා කළ බව ඔහුගේ ශිලා ලේඛන මගින් අනාවරණය කරයි. ඒ අනුව පස්වන ගිරි ලිපියේ ඔහු මෙසේ කියයි. ''සියලු වැසියෝ මගේ ම දරුවෝ ය. ඔවුන් මගේ ම වන හෙයින් ඔවුන්ගේ සුබසාධනය වෙනුවෙන් සම්පූර්ණ පහසුකම් මා විසින් සැපයිය යුතු ය'' ඔවුන්ගේ සන්තෝෂය උදෙසා මා ක්‍රියා කළ යුතු ය.[17]

ඉහත සඳහන් ශිලා ලේඛන විස්තරයට අනුව මනාව පැහැදිලි වන කරුණක් නම් ශිෂ්ටාචාරගත වූ රාජ්‍යයක් තුළ රාජ්‍ය පාලකයා විසින් තම වැසියාගේ සුබසාධන කටයුතු පිළිබඳව ක්‍රමවත්ව සොයා බැලූ බවය. එමෙන් ම රටෙහි ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සියලු රාජ්‍ය අනුග්‍රහය ලබාදී තිබේ. මෙහි ඇති සුවිශේෂී බව නම් ගිරි ලිපි දෙකෙහි ඔහු සඳහන් කරන්නේ සියලු මනුෂ්‍යයන්ට හා සත්වයන්ට තම පාලන ප්‍රදේශවල හා ඉන් පිටත ද වෛද්‍ය පහසුකම් සැපයිය යුතු බවයි. එමෙන් ම මඟ දෙපස ජනතාවට හා සත්වයින්ට අවශ්‍ය ජල පහසුකම් සඳහා ළිං පොකුණු සකස් කළ යුතු බවයි.[18]

ශ්‍රී ලංකාවේ වෛද්‍ය මධස්ථාන පිහිටු වීම සම්බන්ධව ශිලා ලේඛන මූලාශ්‍රය මගින් තොරතුරු බොහෝ ප්‍රමාණයක් හමු වේ. ආරෝග්‍ය ශාලාවල සේවය කළ සියලු සේවකයන් සඳහා පොදුවේ හඳුන්වාදීම සඳහා ''වෙද්හල් වැස්සන්'' යන පදය භාවිත කර ඇත. V වන කාශ්‍යප රජුගේ මැදිගිරි සෙල් ලිපියෙහි මෙය අන්තර්ගත වෙයි.[19] රෝහලක පරිපාලනය සම්බන්ධයෙන් පැන වූ ව්‍යවස්ථාවක් වන මැදිරිගිරි පුවරු ලිපිය සෞඛ්‍ය වෘත්තිකයන් පිළිබඳ ඉතා වැදගත් තොරතුරු අනාවරණය කරයි. ආරෝග්‍ය ශාලාවේ ප්‍රධාන වෛද්‍යවරුන් විසින් රෝගීන්ට ප්‍රතිකාර කිරීම මෙන් ම පරිපාලන සම්බන්ධ කටයුතු ද සිදුකළ බව පෙනී යයි. ඔවුන් ශිලා ලේඛනවල සඳහන් කොට ඇත්තේ ''වෙද් සමිදරුවන්'' යනුවෙනි. මෙහි පරිපාලන කටයුතු භාරව සිටි නිළධාරීන් ''වෙද්හල් කැමියන්'' ලෙස හඳුන්වනු ලැබීය. රෝහල්වල බෙහෙත් සකස් කිරීම වැනි කටයුතු සඳහා වෙන වෙනම කාර්යාංශ වූ බවත් විමලකීර්ති හිමි සඳහන් කරයි.[20] පුරාණයේ ද අද මෙන් වෛද්‍යවරුන්ට ඒ ඒ රෝග සඳහා විශේෂඥයන් වශයෙන් වර්ග

කොට තිබූ බව දක්නට ලැබේ. අනුරාධපුර ජේතවනාරාම සලපතල මළුවේ තිබී හමු වූ ලිපියක ''අඳුන් වෙජ්'' යනුවෙන් සඳහන්ව තිබීමෙන් ඒ බව සනාථ වේ. ''අඳුන් වෙජ්'' යනු අක්ෂි වෙදකම කරන්නා වූ වෛද්‍යවරුන් බව අපට හඳුනා ගැනීමට හැකි විය.[21] චරක සුශ්‍රැත වැනි භාරතීය ග්‍රන්ථවල මෙන් ම හේසජ්ජමංජුසාව, යෝගාර්ණවය, ආදී දේශීය ග්‍රන්ථවල ද අක්ෂි චිකිත්සාව වෙන වෙන ම දක්වා තිබේ.

විශේෂයෙන් මෙම කාල පරිච්ඡේදය වන විට ශල්‍ය වෛද්‍ය ක්‍රමවේදය බහුලව භාවිතයට ගෙන ඇති බව මිහින්තලේ රෝහල් සංකීර්ණය තුළින් හමුවන සියුම් සැත්කම් උපකරණ මගින් පුරාවිද්‍යාත්මකව ඔප්පු වේ. මෙකී වෛද්‍ය ක්‍රමවේද අතර, කුඩැල්ලන් මගින් ද මිනිස් සිරුරේ හටගත් රෝගාබාධ සඳහා පිළියම් යොදා තිබේ. මිහින්තලේ හමුවන ශිලා ලේඛනයෙහි ''පුහුඬා වෙදුන්'' යනුවෙන් හඳුන්වා තිබෙන්නේ මෙම ක්‍රමවේදය අනුගමනය කළ වෛද්‍යවරුන් ය. මෙම ක්‍රමවේදය සුවිශේෂී වෛද්‍ය ක්‍රමවේදයක් ලෙස හඳුනාගත හැකිය. සුශ්‍රුත සංහිතාව[22] අෂ්ටාංගහෘදය සංහිතාව[23] යෝගාර්ණවය[24] යන ග්‍රන්ථවල කුඩලු වෙදකම ශල්‍ය වෛද්‍ය ක්‍රමවේදයක් ලෙස දක්වා තිබේ. කුඩැල්ලා නූතනයේ ජීව විද්‍යාත්මක නාමය අනුව අනෙලිඩා වංශයේ හිරුඩිනියා වර්ගයට අයත් ලේ උරන්නා යන පොදු නාමයෙන් හඳුන්වනු ලබයි. යෝගාර්ණවයේ කුඩැල්ලන් වර්ග 12ක් පමණ දක්වා තිබේ. ඔවුන්ගෙන් හය දෙනෙකු පමණ විෂ රහිත වේ. විෂ සහිත කුඩැල්ලන් වෛද්‍ය ක්‍රමවේදය සඳහා යොදා ගනු නොලැබේ. ඔවුන්ගේ විෂ නිසා රෝගියාට වෙනත් රෝගාබාධ වැළඳිය හැකි බැවිනි. ඒ අනුව වෛද්‍යවරයාට කුඩැල්ලන් උපයෝගී කොට ගෙන සිදු කරනු ලබන ශල්‍යකර්මවල දී මනා ප්‍රවීනත්වයක් තිබිය යුතුය. මෙම ක්‍රමවේදය සත්ත්වයන් සඳහා ද යොදා ගෙන තිබේ. ප්‍රතිකාර කිරීම සඳහා අල්ලා ගනු ලබන කුඩැල්ලන් දින හතක් ගිය පසු කහ වතුරෙන් නහවා පිරිසිදු කොට රෝගය ඇති තැන තැබිය යුතුය. කුඩැල්ලා රෝගය ඇති තැන සපා නොකයි නම් තනකිරි හෝ ලේ බිංදුවක් එම ස්ථානයෙන් තැබිය යුතුය. නැතහොත් එම ස්ථානය තුවාල කොට දිය යුතුය. ලේ උරා බීමේ දී රෝගියාට කිසිදු වේදනාවක් නොදැනේ. කුඩැල්ලන් කැවීමේ ක්‍රමවේදය රෝග කිහිපයක්ම සඳහා භාවිත කරනු ලබයි. සමේ රෝග, හිසරදය, උපදංශ රෝග, පාද ශෝථය, අක්ෂි රෝග ශරීරයේ අපවිත්‍ර වූ ලේ කැටිති නිසා හටගනු ලබන බොහෝ රෝග කාරක සඳහා මෙම ක්‍රමවේදය යොදාගෙන තිබේ.

කුඩැල්ලන් ඇඟ කැවීමේ සම්ප්‍රදායික ප්‍රතිකාර ක්‍රම

පොළොන්නරුවෙන් හමුවන ශල්‍ය වෛද්‍ය උපකරණ

ආරාමික රෝහල්වලින් හමුවන බෙහෙත් ඔරු

ශ්‍රී ලංකාවේ ශල්‍ය වෛද්‍ය ක්‍රමයක් පිළිබඳව අපට මුල් වතාවට හමුවන්නේ බුද්ධදාස රජුගේ රාජ්‍ය සමයෙහි ය. ඒ අනුව

මෙම ක්‍රමවේද ඉතා සුපරික්ෂාකාරීව සිදු කළ යුතු ක්‍රමවේදයකි. වර්තමානයේ ශල්‍ය කර්මයට භාජනය කරනු ලබන රෝගීන් සඳහා විවිධ ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරනු ලබයි. විශේෂිත වූ විෂබීජ හරණ ක්‍රමවේදයන් භාවිත කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව ඒ කාල පරිච්ඡේදය තුළ දී ද ඒ සඳහා විශේෂ ක්‍රමවේදයක් අනුගමනය කරන්නට ඇතැ යි සිතිය හැකිය.

මහාවසංයට අනුව බුද්ධදාස රජු මුල්ම සැත්කම සිදු කරනු ලබන්නේ නාගයෙකුට ය. ඔහුගේ කුසෙහි ඇති විෂ ගෙඩිය ඉවත් කොට ඖෂධ ගල්වා පිළියම් යොදන ලදි. එහි දී එම තුවාලය මැසීම සඳහා යොදාගත් අමුද්‍රව්‍ය පිළිබඳ එතුමාට පුළුල් අවබෝධයක් තිබුණු බව මනාව ඔප්පු වේ. එමෙන් ම මේ සඳහා ඉතා ආරක්ෂිත ක්‍රමවේද යොදා ගන්නට ඇති බව සිතිය හැකිය. සරාර්ථ සංග්‍රහය පරිශීලනය කිරීම තුළින් ඔහු තුළ තිබූ දැනුම ඒ සඳහා තිබූ අත්දැකීම් මනාසේ පිළිබිඹු වේ. මිනිසාට මෙන් ම සත්වයන්ට ද වෙනසක් නොමැතිව අවශ්‍ය ප්‍රතිකාර ක්‍රම හඳුන්වා දී තිබේ.

බුද්ධදාස රජු ඉතා ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයෙක් බව මහාවංසයේ තොරතුරු උපුටා දක්වමින් සාරාර්ථ සංග්‍රහයට ප්‍රස්ථාවනාවක් සපයමින් කුමාරසිංහ මෙසේ සඳහන් කරයි.

- නාගයෙකුගේ හිස තුඹස් ගුලට යවා ඔහුගේ බඩේ පැවත ගෙඩියක් පලා පිළියම් යෙදීම
- පණුවන් සහිත කිරිවැළඳූ හිමි නමකට ඇති වූ බඩේ කැක්කුමට අස් ලෙය පොවා ඒ බව පවසා හිමි පණු අස් යන තුන් පසම සුවපත් කිරීම
- ගිලුණු දියබරි බිත්තරය බඩේ දී ගැසීයාමෙන් උපන් පැටවාට නුලෙකින් ගැට ගැසූ මස් පිඩක් ගිල්වා එමගින් ඔහු එලියට ඇද දැමීම
- සත් වරක් මුඩ ගර්භ වූ සැඩොල් අඟනකට පිළියම් යොදා අටවන වර ඇය සහ ගැබ සුවපත් කිරීම
- ගමක් පාසා වෙදහල් කරවා ගම් දහසකට වෙදදුරෙකු බැගින් යොදවා වැටුප් දී ලෙඩුන්ට නොමිලයේ බෙහෙත් ලබාදීම

එකල පැවති සියලු වෙද පොත්වල සාරය යොදා සාරාර්ථ සංග්‍රහ නමින් මහා වෛද්‍ය ග්‍රන්ථයක් සකු බසින් තැනීම.[25]

මහාවංසයේ 22 වෙනි පරිච්ඡේදයේ ගිලන් වූ භික්ෂුවක් කොටගල විහාරයේ සිට සිවි ගෙයකින් තිස්සමහාරාමයේ සිලාපස්ස පිරිවෙනට ගෙනවිත් නේවාසිකව තබා ඇප උපස්ථාන කළ බවත් ක්ලාන්තව සිටි එම භික්ෂූන් වහන්සේට වෛද්‍ය ප්‍රතිකාර ලබා දුන් බවත් සඳහන් වේ.[26] දුටුගැමුණු රාජ්‍ය සමයේ (ක්‍රි. පූ. 161 - 137) රජු විසින් තමා මරණාසන්න අවස්ථාවේ දී පිං පොත් කිය වූ බව සඳහන් වන අතර ම, ඉන් එක් පිංකමක් වශයෙන් ස්ථාන 18ක දීම රෝගීන්ට බෙහෙත් ආදිය ලබා දීම පිළිබඳ තොරතුරු හමු වේ.[27] ''තව ද මම අනවතරයෙන් අටලොස් තැනක වෛද්‍යවරයන් විසින් විධාන කරන ලද්දා වූ ගිලන් බත් හා බෙහෙත් ගිලනුන්ට දෙවිමි. නිච්චං අට්ඨරසට්ඨානෙ, වෙජ්ජෙහි විහිනං අහං ගිලාන භත්ත භෙසජ්ජං ගිලානානං අදාපයි'' ද්‍රවිඩ පාලනයෙන් රට මුදවා ගැනීමේ දී එළාර රජුගේ සේනාව දුටුගැමුණු රජුගේ කඩොලැතුට ලෝදිය වත් කළේය. එයින් ඇතුට පිළිස්සුම් තුවාල රාශියක් ඇති වූ අතර, ඔහු සුවපත් කිරීම සඳහා වෙදෙකු යෙදූ බව සඳහන් වේ. ''ඇත් වෙදතෙමේ ලාටු ගලවා බෙහෙත් කෙළේ ය.[28] ක්‍රිස්තු වර්ෂ 779-801 අතර කාලයේ රජ කළ දප්පුල රජු පොළොන්නරුවෙහි බෙහෙත් ශාලාවක් කරවීය. එම බෙහෙත් ශාලාවේ කොරුන්ට හා අන්ධයන්ට විශේෂයෙන් බෙහෙත් කළ බවට තොරතුරු අනාවරණය වේ.[29]

රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථාන

ශ්‍රී ලංකාවේ මානව පරිනාමීය ඉතිහාසය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමේ දී එය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වාම ගමන් කරන බව නූතනයේ සිදු කොට ඇති පරියේෂණ මගින් අනාවරණය වී තිබේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයා සංචාරක ජීවිතයක් ගත කළ අතර ඔවුනට දෛනික ජීවිතයේ මුහුණ දීමට සිදුවන යම් යම් රෝගාබාධවලට එම පරිසරයේ තිබූ විවිධ ඖෂධ වර්ග භාවිතයට ගන්නට ඇත. නමුත් විජයාවතරණයත් සමඟ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංකල්පය පිළිබඳ මානවයා තුළ යම් අදහසක් නිර්මාණය වී සංවර්ධනය වූ බවක් වංසකතාගත තොරතුරු මගින් අනාවරණය වේ.

පණ්ඩුවාසු දේව රජුගෙන් පසු රාජ්‍යත්වයට පත් පණ්ඩුකාභය රජු රජ රට ශිෂ්ටාචාරයේ ප්‍රථම නාගරික සංස්කෘතිය බිහි කිරීම සඳහා නගර නිර්මාණ සැලසුම සිදු කරන ලදි. මෙසේ ආරම්භ වූ නාගරික සංස්කෘතිය තුළ ගිහි ජනයා තුළ මෙන් ම භික්ෂු සංස්ථාව තුළ ද ආරාමික බෞද්ධ ස්වස්ථතාව වැඩි දියුණු වූ බව දැකගත හැකි වේ.

ශ්‍රී ලංකාවේ ආරාම ආශ්‍රිතව රෝහල් විශාල ප්‍රමාණයක් නිර්මාණය වී ඇති බව ඓතිහාසික මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් හඳුනාගත හැකි වේ.

01. අනුරාධපුර ඇතුළු නුවර මහ රෝහල,

02. වෙස්සගිරි රෝහල,

03. අනුරාධපුර උතුරින් පිහිටි රෝහල,

04. අනුරාධපුර දෙවෙනි රෝහල,

05. අඹගස්වැව රෝහල,

06. අනුරාධපුර අභයවැව අසල රෝහල,

07. මිහින්තලේ රෝහල,

08. ථූපාරාම රෝහල.

09. අනුරාධපුර මහාවිහාරයේ රෝහල,

10. මැදිරිගිරිය රෝහල,

11. පොළොන්නරු ආලාහන පිරිවෙන රෝහල.

රෝහල් හා බෙහෙත් ශාලාවල ශේෂව ඇති නටබුන්

රෝහල් හා බෙහෙත් ශාලා නටබුන් පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී බොහෝ සෙයින්ම පුරාවිද්‍යාත්මක සාධක වැදගත් වේ. මේ අතරින් බෙහෙවින් ප්‍රසිද්ධියට පත්ව තිබුණේ මිහින්තලය හා මැදිරිගිරි රෝහල් නටබුන් ය. පසුව 1982 දී මහාචාර්ය පී.එල්. ප්‍රේමතිලක විසින් පොළොන්නරු ආළාහන පිරිවෙනෙහි තිබූ රෝහල සොයා ගන්නා ලදි. අභයවැව පාමුල මාපා මාළිගය යනුවෙන් හඳුන්වා දී තිබූ ස්මාරක සත්‍ය වශයෙන්ම අනුරාධපුර යුගයේ ක්‍රියාත්මකව

තිබූ ප්‍රධාන රෝහලක නටබුන් බව හඳුනා ගැනීමට හැකි විය. එය මිහින්තලේ රෝහලට සම්පූර්ණයෙන් ම සමාන රෝහලක් බව එම රෝහල් දෙකෙහි නටබුන් සන්සන්දනාත්මකව අධ්‍යයනයෙන් තහවුරු විය. මීට අමතරව එසේ අභිනවයෙන් හඳුනාගත් පුරාණ වෛද්‍ය මධ්‍යස්ථාන ලෙස අඹගස්වැව රෝහල, අභයගිරියට උතුරින් ඇති රෝහලක නටබුන්, ඇතුළු නුවර රෝහලක නටබුන් දැක්විය හැකිය. එසේ ම මෙතෙක් අධ්‍යයනයන්හි නාමිකව පමණක් සඳහන් කොට තිබූ අනුරාධපුර ථූපාරාම බෙහෙත් ගෙය හා අනුරාධපුර මහාවිහාර රෝහල ආදියෙහි නටබුන් මූලාශ්‍රය වශයෙන් වැදගත් වේ. ආරාම ආශ්‍රිතව පැවැති රෝහල් වර්ග කිරීමේ දී ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැකිය.

01. නිශ්චිත ආරාමික රෝහල්

02. නිශ්චිත නොවූවත් ආරාමික රෝහල් ලෙස සැලකිය හැකි ස්ථාන

03. රෝහල් ලෙස අල්ප වශයෙන් හඳුනාගත හැකි ස්ථාන

01. නිශ්චිත ආරාමික රෝහල්

සාහිත්‍යමය හා අභිලේඛනමය සාධක බෙහෙත් ඔරු ඇතුළු පුරාවිද්‍යා සාධක යන ඒවා භාවිත කරමින් ආරාමික රෝහල් වශයෙන් මේ වන විට හඳුනාගත් ප්‍රසිද්ධියට පත් කොට ඇති වාස්තුවිද්‍යා අවශේෂ සහිත ක්ෂේත්‍ර මේ ගණයට ඇතුළත් වේ.

01. මිහින්තලේ රෝහල

02. මැදිගිරිය රෝහල

03. පොළොන්නරු ආළාහන පිරිවෙන රෝහල[30]

02. නිශ්චිත නොවූවත් ආරාමික රෝහල් ලෙස සැළකිය හැකි ස්ථාන

නිශ්චිත නොවූවත් ආරාම රෝහල් ලෙස සැළකීමට වැඩි අවධානයක් ඇති ස්ථාන තිබේ. අදාළ ස්ථානවල හමු වූ බෙහෙත්

ඔරු ඇතැම් විට එම ස්ථානයෙන් හමු වූ ඇඹරුම්ගල් ආදී අනෙකුත් පුරාවස්තූන් මත මේවා හඳුනා ගැනීම පහසු ය.

01. ථූපාරාම රෝහල

02. මහාවිහාරයේ රුවන්වැලිසෑය රෝහල[31]

03. රෝහල් ලෙස අල්ප වශයෙන් හඳුනාගත හැකි ස්ථාන

අදාළ ස්ථානවල බෙහෙත් ඔරු හෝ වෙනත් පුරාවිද්‍යා සාධක හමු වී නැති හුදෙක් මේ ස්ථානවල පවත්නා වාස්තු විද්‍යාත්මක අංගවල සැලැස්ම පාදක කර ගනිමින් ඒවා නටබුන් මගින් අධ්‍යයනය කිරීම.

01. බසවක්කුලම අසල ''මාපා මාළිගය'' නම් වූ ස්ථානයේ ගොඩනැගිල්ල

02. අභයගිරි විහාරයේ ''වළව්ව'' නමින් හැඳින්වෙන ගොඩනැගිල්ල[32]



බණ්ඩාරනායකගේ මෙම වර්ගීකරණයට අනුව නිර්මිත පරිසරය තුළ ස්ථාපනය කොට ඇති මෙම රෝහල්වල වාස්තු විද්‍යාත්මක අංග ලක්ෂණයන් එක හා සමාන බවක් දැකගත හැකි වේ. ඒ අනුව මිහින්තලේ රෝහල හා අනුරාධපුර බසවක්කුලම වැව ආසන්නයේ පිහිටුවා ඇති මාපා මාළිගය නමින් හැඳින්වෙන රෝහල් ගොඩනැගිල්ල විශාල මැද මිදුලක් සහිතව නිර්මාණය කොට තිබේ. මෙම මැද මිදුලෙහි උස් මණ්ඩපයක් සකස් කොට එහි බුද්ධ

මන්දිරයක් සකස් කර තිබූ බවට සාධක හමු වේ. එම තොරතුරුවලට අනුව පෙනී යන්නේ කායික රෝග සඳහා ඖෂධීය ප්‍රතිකාර ලබා දුන් අතර, මානසික ව්‍යාකූලතා සන්සිඳ වීම සඳහා බුදුදහමේ අධ්‍යාත්මක ගුණවගාව ඒ තුළින් ලබා දුන් බවය. විශේෂයෙන් නේවාසිකව රෝහලේ ප්‍රතිකාර ලබන්නෙකුට එය මහත් වූ අස්වැසිල්ලක් වන්නට විය. මෙම රෝහල් තුළ ශල්‍ය කර්මයන් බොහෝමයක් සිදු කළ බවට බොහෝ සාධක හමු වේ. දනන්ජය ගම්ලත් මහත්මා මුල් කාලයේ මෙම රෝහල ප්‍රතිමා ගෘහයක් ලෙස හඳුනාගෙන තිබේ. එයට හේතුව වන්නට ඇත්තේ මෙම බුද්ධ මන්දිරය නිසා විය හැකිය. පොළොන්නරුවේ මැදිරිගිරි විහාරයේ පිහිටුවා ඇති රෝහල මධ්‍යයේ ද කුඩා ප්‍රමාණයේ බුද්ධ ප්‍රතිමාවක් තබා තිබූ බවට සාධක හමු වේ. නමුත් මෙහි ඒ සඳහා විශේෂ මණ්ඩපයක් ඉදි කොට නොමැත. මහාවිහාරයේ රෝහල හා ථූපාරාම රෝහල යන රෝහල් දෙකෙහි එක හා සමාන ලක්ෂණයන් දැකගත හැකි වේ. එහි මැද මිදුලක් සකස් කර නොමැත. පොළොන්නරු ආළාහන පිරිවෙන් රෝහලේ මැද මිදුල් දෙකක් හා වැසිකිළි සංකීර්ණයක් සහිතව නිර්මාණය කොට තිබේ.



ලක්දිව වූ ආයුර්වේද රෝහල් පිළිබඳ මහාවංසයේ නොයෙක් පරිච්ඡේදවල ඒ ඒ අවස්ථාවන්හි විස්තර හමු වේ. ඒ පිළිබඳ වෛද්‍ය ඩි.එම්. ජයසිංහ විසින් කරන ලද එකතුවක් පහත දැක්වේ.

- සිවිකාසාලා (සූතිකාගාරය)
- සොතථිසාලා

- ගිලාන සාලා
- වෙජ්ජසාලා
- පඬිගුනං (කොරුන්ට)
- පසවන්තීනං (ප්‍රසව වේදනා යුක්ත ස්ත්‍රීන්ට)
- කණානං සාලකෙ (අන්ධයින්ට)
- උපසග්ග රෝග වෙජ්ජසාලං (බෝවන රෝග)
- භික්ෂු වෛද්‍ය සාලා[33]

මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යාශාස්ත්‍ර නැමැති ග්‍රන්ථයෙහි ස්වස්ථතාවට සම්බන්ධ රෝහල්, ජන්තාඝර, වැසිකිළි හා කැසිකිළි යන අංග නිර්මාණය කරගත යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබා දී තිබේ. ''රෝගාලය'' හෙවත් රෝහල නිතරම පාහේ දක්නට ලැබෙන්නේ මුඛ්‍ය කෝෂ්ඨයෙහි ය. කලාතුරෙකින් එය වායු හෝ සෝම කෝෂ්ඨයෙහි පිහිටියේ ය. වාරිශාලාව හෙවත් ජන්තාඝරය සෑම විට ම වාගේ ආරාමයෙහි නිරිත දෙසට විශේෂයෙන් වරුණ හා මිත්‍ර කෝෂ්ඨවලට සීමා විණි. ස්‍රෑත ශාලාව හෙවත් කැසිකිළිය හා මළ මෝක්ෂ හෙවත් වැසිකිළිය ද සඳහන් වී ඇත්තේ එකම එක් වරකි. ඒ දකුණු දෙසින් දොරටුව පිහිටි ගෝකුලාරාමය විස්තරවන තැනයි. මෙහදී ඉතාමත් සහේතුකව කැසිකිළිය වායු කෝෂ්ඨයට ද වැසිකිළිය වරුණ කෝෂ්ඨයට ද ඇතුළත් කොට ඇත. උතුරු දෙසින් ප්‍රධාන දොරටුව පිහිටි තොලුවිල නේවාසික සංකීර්ණයේ කැසිකිළි හා වැසිකිළිය අග්නි භාගයේ පිහිටා තිබීම යුක්ති සහගත ය.[34]

සමාලෝචනය

ඓතිහාසික බෞද්ධ ආරාමික වෛද්‍ය ක්‍රමවේද හා චිකිත්සක විධික්‍රම පිළිබඳ කරුණු විමර්ශනය කිරීමේදී ශ්‍රී ලංකාවේ මානව සංහතියේ ස්වස්ථතාව පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමේ දී එහි මූල බීජය ඉතා ඈතට දිවයන බව දක්නට ලැබේ. ත්‍රිපිටකාගත තොරතුරුවලට අනුව බුදුදහමේ ආලෝකය සමගින් සෞඛ්‍ය සංරක්ෂණීය ක්‍රමවේද රාශියක් බිහිවන්නට විය. රාජධානි ආරම්භයත් මිනිසා ශිෂ්ටත්වයට පත්වීමත් මූලික කොට ගෙන සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට හැමවිටම උත්සහ දරා තිබේ. ශ්‍රී ලංකාව තුළ ක්‍රි.පූ. 3 වන සියවසට පෙර

වුව ද ඒ ඒ පරිසරයට අනුගතව නිරෝගි බව උදෙසා අවශ්‍ය ඖෂධ වර්ග ඒ පරිසරය තුළින් සකසාගත් බවක් උපකල්පනය කළ හැකිය. නොඑසේ නම් රාජධානි ආරම්භ වීමත් සමග මේ සියල්ල එකවර පහළ වූවක් බව සිතිය නොහැකිය. ඒ අනුව ක්‍රි.පූ. 3 වන සියවසේ සිට 10 වන සියවස දක්වා කාල පරිච්ඡේදය තුළ අනුරාධපුර යුගය තුළ එම ආභෂය ලබමින් දියුණු සෞඛ්‍ය සංරක්ෂණීය ක්‍රමවේදයන් රාශියක් අනුගමනය කොට ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ සිදු වූ සෞඛ්‍යාරක්ෂාව පිළිබඳව කරුණු අධ්‍යයනය කිරීමේ දී මනාව පෙනී යන්නේ පසුකාලීනව උත්තර භාරතීය වෛද්‍ය ක්‍රමයේ ආභාෂය බහුලව මෙරටට ආගමනය වූ බවක් ය. කෙසේ නමුදු එම ආභාෂය අරමුණු කොටගෙන මෙරටට උචිත වෛද්‍ය ක්‍රමයක් සකසාගත් බව එම කරුණු මගින් නිගමනය කළ හැකිය. එසේ ක්‍රමයෙන් ඇරඹී වෛද්‍ය ක්‍රමය අනුරාධපුර යුගයෙන් ක්‍රි.පූ. 10 වන සිය වසවන විට පොළොන්නරුවට සංක්‍රමණය වූ පසුත් එය ඉතා දියුණු මට්ටමක පැවැති බව දක්නට ලැබේ. ඒ අනුව මිහින්තලයෙන් හමුවන ශල්‍ය වෛද්‍ය උපකරණවලට වඩා දියුණු මට්ටමක ශල්‍ය වෛද්‍ය උපකරණ රාශියක් පොළොන්නරුව ආලාහන පිරිවෙන් රෝහල් සංකීර්ණයෙන් හමු වේ. ඒ අනුව මෙම යුග දෙක තුළම අවශ්‍යතාවයන් අනුව වෛද්‍ය කටයුතු දියුණු වූ බව දක්නට ලැබේ. ඒ අනුව යුගයෙන් යුගයට අලුත්ම ක්‍රමවේද බිහි වී නොමැත. ඒ ඒ යුගවල මිනිසා තුළ පැවැති සක්‍යතාවය හා මනාවූ දැනුම උපයෝගි කොට ගෙන මේ සියලු කටයුතු නිර්මාණය වූ බව ලැබෙන සාධක අනුව නිගමනය කළ හැකිය.

අනුරාධපුර අභයවැව අසල රෝහල

මිහින්තලේ රෝහල

ථූපාරාම රෝහල

අනුරාධපුර මහාවිහාරයේ රෝහල

මැදිරිගිරිය රෝහල

පොළොන්නරු ආලාහන පිරිවෙන් රෝහල

ආන්තික සටහන්

1. *Inscriptions of Asoka*, E. Hultzsch, (1969), Indological Book House, Delhi, 03
2. -ibid-
3. සිරි ලියනගේ, *බෞද්ධ ශබ්ද කෝෂය*, ඉදුරු ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, හයිලෙවල් පාර, කොට්ටාව, 2007, පි. 1670
4. හේවාමානගේ විමල්, *බෞද්ධ ස්වස්ථතාව*, සමයවර්ධන ශිල්පියෝ, මරදාන, කොළඹ, 2008, පි. 02
5. *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය*, වැලිවිටියේ සෝරත හිමි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, කොළඹ, 1999, පි. 364
6. *සාරාර්ථ සංග්‍රහය*, ආරාය්දාස කුමාරසිංහ, කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ, 1987, පි. 190-212

7. එම, පී. 212-272

8. එම, පී. 273-287

9. රාමනායක ලීලා, *පෙරදිග වෙදපුරාණය*, සීමාසහිත දීපානි මුද්‍රණය, ගංගොඩවිල, නුගේගොඩ, 2016, පි. 171-172

10. එම, පි. 172

11. ඛුද්දක නිකාය, *ධම්මපදපාළිය*, බු.ජ.ත්‍රි. මුද්‍රණය බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 1960, පි. 30

12. *අංගුත්තර නිකාය*, දුතිය වග්ගය, බු.ජ.ත්‍රි. මුද්‍රණය බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 2005, පි. 199

13. *විනය පිටකය*, සොයිසා, ඒ.පී.ද, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2015, පි. 1020

14. *මහාවග්ගපාළි 2*, බු.ජ.මු, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 2005, පි. 521

15. එම : 524-525

16. *මහාවග්ගපාළි 2*, බු.ජ.මු, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල, 2005, පි. 527

17. ඥානවිමල හිමි, බෙල්ලන, *අශෝක ශිලා ලේඛන*, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන, කොළඹ, 2000, පි. 18 *Inscriptions of Asoka*, E. Hultzsch, (1969), Indological Book House, Delhi, 33

18. එම, පි. 13

19. *Epigraphia Zeylanica*, Vols. II, Department of Archaeology, Colombo, 2011, P. 29

20. ibid P. 50-57

21. ibid P. 253

22. කුමාරසිංහ ආරියදාස, *සුශ්‍රැත සංහිතාව*, ආයුර්වේද දෙපාර්තමේන්තුව, ගංගොඩවිල, නුගේගොඩ, 1962, පි. 47-50

23. ශ්‍රී ශිලක්ඛන්ධ ස්ථවිර, අලුත්ගම, *අෂ්ටාංගහෘදය සංහිතාව*, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය. 2012, පි. 163-164

24. සෝමසිරි දයානන්ද, ආර්. එම්, *යෝගාර්ණවය*, චතුර මුද්‍රණාලය, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය, 1962, පි.664

25. කුමාරසිංහ ආරියදාස, *සාරාර්ථ සංග්‍රහය*, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, 1987, XXV

26. *මහාවංසය*, රත්න පොත් ප්‍රකාශකයෝ, 1994, පි. 100

27. *මහාවංසය*, රත්න පොත් ප්‍රකාශකයෝ, 1994, පි. 39-40

28. එම, පි.33-34

29. එම, පි.18-19

30. Bandaranayake, *ASCAR Report*, 1974, P. 43 - 250

31. ibid

32. ibid

33. හේවාමානගේ විමල්, *බෞද්ධ ස්වස්ථතාව*, සමයවර්ධන ශිල්පියෝ, මරදාන, කොළඹ, 2008, පි. 39

34. මාරසිංහ, වෝල්ටර්, *මඤ්ජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර*, සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ, 2014, පි. II